# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2338/37 – 2023 ජුනි මස 28 වැනි බදාදා – 2023.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුරුතාමුරය බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කන්දබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, මුරුතාමුරය (අ.ග.පි. 185) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MA/HKM/2022/56 හා 2022.03.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – ගමගේයිදිවෙලේ මැද ඉරිකොන්ද සහ ගොඩඉරිකොන්ද – ප්‍රමාණය: හෙක්. 0.0304**

උතුරට: සුදත් මුණසිංහ හිමිකම් කියන ගමගේයිදිවෙලේ මැද ඉරිකොන්ද සහ ගොඩඉරිකොන්ද; නැගෙනහිරට: එච්. ඩබ්ලිව්. නිහාල් ප්‍රේමකුමාර හිමිකම් කියන ගමගේයිදිවෙලේ මැද ඉරිකොන්ද සහ ගොඩඉරිකොන්ද; දකුණට: එච්. ඩබ්ලිව්. නිහාල් ප්‍රේමකුමාර හිමිකම් කියන ගමගේයිදිවෙලේ මැද ඉරිකොන්ද සහ ගොඩඉරිකොන්ද (ප්‍රවේශ මාර්ගය); බටහිරට: මාර්ගය (ප්‍රා.ස.) සහ සුදත් මුණසිංහ හිමිකම් කියන ගමගේයිදිවෙලේ මැද ඉරිකොන්ද සහ ගොඩඉරිකොන්ද.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2021/WS/333.
2023 අප්‍රේල් මස 10 වැනි දින.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 06 – 0224

1A – G039788 – 14 (2023/06)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*